ඉබ්නු මස්උෟද් -රළියල්ලාහු අන්හු- තුමා සෑම බ්රහස්පතින්දාවකම අපට උපදෙස් දෙන්නට විය.

ෂකීක් ඉබ්නු සලමා -රහිමහුල්ලාහ්- තුමා විසින් වාර්තා කරන ලදී. ඉබ්නු මස්උෟද් - රළියල්ලාහු අන්හු- තුමා සෑම බ්රහස්පතින්දාවකම අපට උපදෙස් දෙන්නට විය.එවිට මිනිසෙකු ඔහු දෙස බලා අහෝ අබ්දුර් රහ්මාන් ඔබ සෑම දිනකම එසේ අපට උපදෙස් දෙන්නේ නම් එය මම ප්රිය කරමි යැයි පැවසුවේය. එවිට ඔහු: එය එයින් මා වළක්වනු ඇත. සැබැවින්ම ඔබ
දුෂ්කරතාවට පත් කිරීමට මම පිළිකුල් කරමි තවද අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු
අලය්හි වසල්ලම්- තුමා අපට දුෂ්කර වේවි යැයි බියෙන් එතුමා එසේ අප සමග කටයුතු කළාක් මෙන් සැබැවින්ම මම ද උපදෙස් දීමෙන් කටයුතු කරමි යැයි පැවසීය.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

ෂකීක් ඉබ්නු සලමා -රහිමහුල්ලාහ්- තුමා මෙසේ දන්වා සිටියි. සැබැවින්ම ඉබ්නු මස්ඌද් - රළියල්ලාහු අන්හු- තුමා සෑම බ්රහස්පතින්දාවකම ඔවුනට උපදෙස් දෙන්නෙකු වූහ. එවිට මිනිසෙකු එතුමා දෙස බලා සෑම දිනකම ඔබ අපට උපදෙස් දීම අපි ප්රිය කරන්නෙමු යැයි පැවසීය. එවිට එතුමා සැබැවින්ම එයින් මා වළක්වාලීයේ ඔබ දුෂ්කරතාවට පත්වීම මා පිළිකුල් කරන බැවිනි. සැබැවින්ම මම ඔබට උපදෙස් දීම පුරුද්දක් බවට පත් කරමි. ඒ වෙත වූ ඔබලාගේ අවශ්යතාව නැතිවීමත් මා පිළිකුල් කරමි. අප සමග අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා එසේ කටයුතු කර ඇත්තාහ. එය අප දුෂ්කරතාවට වැටෙන බියෙනි. එසේ දුෂ්කරතාවක් ඇති අවස්ථාවක උපදෙස බලපෑමක් නොකරනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/3082